[සියලු ම හිමිකම් ඇවිරිණි ] முழுப் பதிப்புரிமையுடையது ]All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

15 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2016 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2016 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2016

ක්‍රිස්තියානි ධර්මය I, II
கிறிஸ்தவம் I, II
Christianity I, II

## ක්‍රිස්තියානි ධර්මය II

* **පළමුවන** ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළුව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
* පළමුවන ප්‍රශ්නයට ලකුණු **20** ක් ද, තෝරා ගන්නා එක් ප්‍රශ්නයකට ලකුණු **10** බැගින් ද හිමි වේ.

**1.** (i) (අ) "මෙහෙයුරු දිවැසිවර" ලෙස හඳුන්වා ඇත්තේ කවුරුන් ද?
(ආ) එසේ පවසා ඇත්තේ කුමන ප්‍රශංසා ගීයේ ද?
(ii) නාසරත්හි සිනගෝගයේ ජේසුස් වහන්සේ සිය ප්‍රථම දේශනයේ ඉදිරිපත් කළ පිරුළු **දෙක** ලියන්න.
(iii) (අ) ජේසුස් වහන්සේට කුරුසිය උසුලාගෙන යෑමට උරදීමට සිදු වූයේ කා හට ද?
(ආ) එයින් කිතුනු අපට ගෙන දෙන අභියෝගය කුමක් ද?
(iv) "ජීවමාන තැනැත්වහන්සේ මළවුන් අතර සොයන්නේ මන් ද"
(අ) දේවදූතුන් මෙසේ පැවසුවේ කාටහට ද?
(ආ) එයින් අද අප ලබන වැදගත් පණිවුඩය කුමක් ද?
(v) "ස්වාමිනි...... ඔබ මාගේ පියස යටට වැඩමවා ගැනීමට මම නොවටිමි...... වචන මාත්‍රයක් පැවසුව මැනව මාගේ දාසයා සුව වන්නේ ය" ශතාධිපතියාගේ මෙම ප්‍රකාශයේ ඉදිරිපත් කෙරෙන වැදගත් චරිත ලක්ෂණ **දෙකක්** ලියන්න.
(vi) (අ) දසපනතෙහි අඩංගු පොරොන්දුවක් සහිත පනත ලියා දක්වන්න.
(ආ) එය කීවෙනි පනත ද?
(vii) **මට පෙරටුව** ගොස් මාගේ මාර්ගය පිළියෙළ කරන්නා වූ මාගේ දූතයා මට පෙරටුව එවන්නෙමි.
(අ) මෙම දිවැස්වැකිය ප්‍රකාශ කළේ කුමන දිවැසිවරයා ද?
(ආ) තද අකුරින් ලියවී ඇති පදය පහදන්න.
(viii) (අ) ජේසුස් වහන්සේ මෙලොව ස්ථාපිත කළ නව ගිවිසුම කුමක් ද?
(ආ) එය ස්ථාපිත කළේ කුමන අවස්ථාවේ ද?
(ix) (අ) රාත්‍රි කාලයේ ජේසුස් වහන්සේ වෙත පැමිණ ඔහුගේ ප්‍රශ්නවලට විසඳුම් සෙවූ ජුදෙව් නායකයා නම් කරන්න.
(ආ) ජේසුස් වහන්සේ ඔහුට දුන් පිළිතුර මගින් කිතුනු අප අනුගත කර ගත යුත්තේ කුමන සත්‍යයක් ද?
(x) ජේසුස් වහන්සේගේ උත්තරීතර ගුණාංගයක් වූ සමාවීම අනුගමනය කරමින් තමාහට වරදකළ අයට සිරමැදිරට ගොස් සමාව දානය කළ මෑතකාලීන කිතුනු පූජකවරු **දෙදෙනෙක්** නම් කරන්න.

WWW.OLEVELAPI.COM

**2.** (i) "ඔබත් ගොස් එසේම කරන්න." ජේසුස් වහන්සේ මෙසේ පැවසුවේ කාහට ද? ඊට පසුබිම් වූ අවස්ථාව කුමක් ද?
(ii) (අ) එම අවස්ථාව පැහැදිලි කිරීමට ජේසුස් වහන්සේ ගෙනහැරපාන ලද උපමාවේ චරිත **තුන** මොනවා ද?
(ආ) ඒ සඳහා ඔවුන් දැක්වූ ප්‍රතිචාර ලුහුඩින් ලියන්න.
(iii) එම උපමා කථාවේ යහපත් චරිතය මගින් විදහාපාන, අප අනුගත කරගත යුතු ආදර්ශ **පහක්** විස්තර කරන්න.

**3.** 'ජුදා සමාජයේ සිටි ප්‍රධාන ආගමික කණ්ඩායම් ජේසුස් වහන්සේ හා සංවාදයේ යෙදුණි.'
(i) (අ) එකල ජුදා සමාජයේ සිටි ප්‍රධාන ආගමික කණ්ඩායම් **දෙක** නම් කරන්න.
(ආ) ඔවුන්ගේ මධ්‍යස්ථාන වූයේ කුමන ස්ථාන ද?
(ii) එම ආගමික කණ්ඩායම් මගින් ජේසුස් වහන්සේ වෙත ඉදිරිපත් කළ පහත සඳහන් අභියෝග හා ප්‍රශ්නවලට ජේසුස් වහන්සේ දැක්වූ ප්‍රතිචාර ලියන්න.
(අ) පව්කරුවන් ඇසුරු කිරීම පිළිබඳ අභියෝගය
(ආ) සබත් දින සුව කිරීම පිළිබඳ අභියෝගය
(ඉ) පුනරුජ්ජීවනය පිළිබඳ ප්‍රශ්නය
(iii) එදා ආගමික කණ්ඩායම් සමග ඇතිවූ එම සංවාදවල දී ජේසුස් වහන්සේගේ ප්‍රතිචාරවලින් කිතුනු අපට අවධාරණය කෙරෙන උතුම් ගුණාංග කවරේ ද?

[හයවැනි පිටුව බලන්න

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

4. "ජේසුස් වහන්සේ විශිෂ්ට ගුරුවරයෙක් විය"

(i) දේවරාජ්‍යයේ ගැඹුරු ගුණධර්ම සාමාන්‍ය පොදු ජනතාවට ඉදිරිපත් කිරිමෙහි ලා භාවිත කළ උපක්‍රම **දෙකක්** ඉදිරිපත් කරන්න.

(ii) මිටියාවතේ දේශනය මගින් ජේසුස් වහන්සේ ප්‍රකාශ කළ භාග්‍ය වාක්‍ය තුන සම්පූර්ණ කරන්න.

(අ) දිළිඳු වූ ඔබ භාග්‍යවන්තයෝය - මන්ද

(ආ) සාගිනි වූ ඔබ භාග්‍යවන්තයෝය - මන්ද

(ඉ) කඳුළු සලන ඔබ භාග්‍යවන්තයෝය - මන්ද

(iii) කිතුනු ඔබ එම භාග්‍ය වාක්‍ය පදනම් කරගෙන එහි අධ්‍යාත්මික සත්‍යයන් ජීවිතය තුළින් ක්‍රියාවට නංවන්නේ කෙසේ ද?

5. (i) (අ) I වන ධර්මදූත චාරිකාව සඳහා පාවුල් සමග යෑමට තෝරා ගනු ලැබූ අනික් ධර්මදූත සේවකයා නම් කරන්න.

(ආ) මොවුන් තෝරා ගැනීමට පෙර අන්තියෝකයේ ගෝලයන් සූදානම් වූයේ කෙසේ ද?

(ii) පහත සඳහන් ස්ථාන අතුරෙන් **තුනක්** තෝරා ධර්මදූත සේවකයන් එම ස්ථානවල දී මුහුණදුන් අභියෝග ඉදිරිපත් කරන්න.

(අ) පාපස්

(ආ) ලුස්ත්‍රාව

(ඉ) පිලිප්පිය

(ඊ) ඇතන්ස්

(iii) එම අවස්ථාවල දී ධර්මදූත සේවකයන්ගේ ක්‍රියාකාරිත්වයෙන් වත්මන් කිතුනුවනට සහ ධර්මදූත සේවකයන්ට ලබා ගත හැකි මඟ පෙන්වීම් **පහක්** ලියන්න.

6. 'ඔබේ වස්තුව කොතැනද ඔබේ සිතත් එතැනය'

(i) වස්තුව පිළිබඳ මෙලෙස පැවසූ ජේසුස් වහන්සේ ලෞකික ධන සම්පත්වල ආදීනව දැක්වීමට ගෙනහැර පානලද උපමා **දෙක** සඳහන් කරන්න.

(ii) එම උපමා කථා මගින් ජේසුස් වහන්සේ ධනය සම්බන්ධයෙන් අනාවරණය කළ වැදගත් ආකල්ප **තුනක්** ලියන්න.

(iii) දිළිඳු බව පිටු දැකීම සඳහා ඔබ අතර ජීවත්වන දිළිඳු ළමයකුට එම තත්ත්වයෙන් ගොඩඒමට ඔබ කෙසේ ක්‍රියාකාරන්නේ ද යන්නට කරුණු **පහක්** ඉදිරිපත් කරන්න.

7. පහත සඳහන් මාතෘකාවලින් **දෙකක්** තෝරා ගෙන කෙටි සටහන් ලියන්න. (බයිබලයෙන් උදාහරණ සහිතව)

(i) යාච්ඤාව

(ii) ස්තුතිවන්තභාවය

(iii) මුල් කිතුනු සභාවෙන් වත්මන් සභාවලට ආදර්ශ

(iv) දිව්‍යස්මෙහෙවරවල වැදගත්කම

***

WWW.OLEVELAPI.COM

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...